සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 40 S |
|---|---|---|

නම ..............................................

**පෙරදිග සංගීතය** | **කාලය පැය දෙකයි**

- **සැළකිය යුතුයි:-** **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
  **ප්‍රශ්න අංක 1-5 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ස රි ග ම ප ධ නි යනුවෙන් හඳුන්වන්නේ
i. ස්වර අෂ්ඨකයයි ii. ස්වර සප්තකයයි.
iii. අවරෝහණ ස්වරයි. iv. කෝමළ ස්වරයි

02. ස රි ග, රි ග ම, .................. යන ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදිය යුතු ස්වර ඛණ්ඩය වන්නේ
i. මපධ ii. ගමප iii. ධනිස් iv. පධනි

03. අවනද්ධ භාණ්ඩයක් වන්නේ මින් කුමක් ද?
I. බටනළාව ii. තබ්ලාව iii. මැන්ඩලීනය iv. එස්රාජය

04. ලෝක සංගීතය බෙදෙන ප්‍රධාන කොටස් දෙක වන්නේ,
i. පෙරදිග සහ කර්ණාටක ii. හින්දුස්ථානී සහ කර්ණාටක
iii. පෙරදිග හා දේශීය iv. පෙරදිග සහ අපරදිග

05. ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් වන්නේ මින් කුමක් ද?
I. සෙන්පතියන් ගැන ii. මුණිසිරිපාදේ
iii. සොම්නස හෝ සන්තාපය හමුවේ iv. අහසට පිඹිනා එරන් කළේයා

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට A තීරුවේ ගැලපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.**

| **A** ස්වර ස්ථාපන ගීතය | **B** ස්වර පරාසය |
|---|---|
| 06. i. හොඳ දේ සිතමි සිතුදේ කියමි | ස සිට ග ස්වරය දක්වා |
| 07. ii. ඇත ආකහේ පාට පාට මල් | ස සිට සං දක්වා |
| 08. iii. එකට සතුටු සාගරේ | ස සිට රි ස්වරය දක්වා |
| 09. iv. කඳු පෙළ අතරේ | ස සිට ම දක්වා |
| 10. v. මුණි සිරිපා දේ | ස සිට ප දක්වා |

- **ප්‍රශ්න අංක 11-15 දක්වා දීඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

11. ගායනයේ දී කටහඬ ඉපදවීමට , හඬ පාලනයට ශ්වසන අභ්‍යාස වල යෙදීම ඉතා ප්‍රයෝජනවත් ය. (   )

12. "ඉරෙන් හඳෙන්" ගීතය ස්වර ස්ථාපන ගීතයකි. (   )

13. මෙලෝඩිකාව සහ ග්ලොකන් ස්පීලය පහසුවෙන් වාදනය කළ හැකි සරල සංගීත භාණ්ඩ වේ. (   )

14. සරි, රිග, ගම, මප, පධ, ධනි, නිසං ..................... යනු ශුද්ධ ස්වර අභ්‍යාසයකි. (   )

15. බායං සහ දායං යනුවෙන් තබ්ලාව කොටස් දෙකකින් යුක්ත ය. (   )



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **ප්‍රශ්න අංක 16 -20 දක්වා ඇති ප්‍රශ්න සඳහා වරහන්තුල දීඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස් තැනෙහි ලියන්න.**

(ම, ප, ග, ධ, සි)

16. පෙරදිග සංගීතයේ ගාන්ධාරය ලෙස නම් කරනු ලබන්නේ ............................................... ස්වරයයි.

17. ................................ ස්වරය යනු බටහිර සංගීතයේ දී ගායනය කරනු ලබන So(සෝ) ස්වරය වේ.

18. බටහිර සංගීතයේ දී F අක්ෂරයෙන් සංකේතවත් කරන්නේ ............................ ස්වරයයි.

19. උච්ච ස්වරයක් හඳුනා ගැනීමට සංකේතයක් යොදා ඇත්තේ .................................. ස්වරයටයි.

20. ධෛවතය යනුවෙන් හඳුන්වනු ලබන්නේ .................................. ස්වරයයි.

# II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

(01) ඔබ විසින් පන්ති කාමරයේ දී කරනු ලැබූ ස්වසන අභ්‍යාස 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5 x 2)

(02) i. ස්වර පුවරුවක් ඇඳ එහි ශුද්ධ ස්වර 07 ලකුණු කරන්න. (ල. 08)
ii. ස්වර පුවරු භාණ්ඩ වර්ගයට අයත් භාණ්ඩ 02 ක් නම් කරන්න. (ල. 02)

(03) පහත වරහන් තුළ සඳහන් සංගීත භාණ්ඩ අදාළ කොටස්වලට ඇතුළත් කරන්න.
( මවුත් ඕගනය, ගිටාරය, වයලීන්, බටනලා,මෙලෝඩිකා, එස්රාජ, මැණ්ඩලීන, සර්පිනා, අත් රබාන, තබ්ලාව)

1. තත් භාණ්ඩ - ................................................
2. සුෂිර භාණ්ඩ - ................................................
3. ස්වර පුවරු භාණ්ඩ - ................................................
4. අවනද්ධ භාණ්ඩ - ................................................
5. pick එකක් ආධාරයෙන් වයන භාණ්ඩ - ................................................ (ල. 2x5)

(04) i. ඔබ පන්ති කාමරයේ දී ගායනය කළ ළමා ගීත අතුරින් එක් ගීතයක මුල් කොටසෙහි පද මාලාව ලියන්න. (ල. 06)

ii. "සෙන්පතියන් ගැන, නැව්පතියන්" ගැන යන ගීතයෙහි සංගීත නිර්මාණය හා ගායනය කවුරුත් විසින් කරන ලද්දේ දැයි ලියා දක්වන්න. (ල. 04)

(05) i. ඔබ උගත් ස්වර ස්ථාපන ගී අතුරින් එක් ගීතයක ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න. (ල. 06)
ii. ස්වර ස්ථාපන ගීත ගායනයෙන් ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න. (ල. 04)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk